රාජ්‍ය ළමා නාට්‍ය උළෙල 2020
අරச சிறுவர் நாடக விழா
State Children's Drama Festival

# රාජ්‍ය ළමා නාට්‍ය උළෙල - 2020
## (සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි)

බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යාංශය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ රාජ්‍ය නාට්‍ය අනුමණ්ඩලය එක්ව සංවිධානය කරන **2020 රාජ්‍ය ළමා නාට්‍ය උළෙල** සඳහා සිංහල,දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සියලුම අයදුම්කරුවන් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර, ළමා නාට්‍යයේ පිටපත් 03ක් සහ සාරාංශ පිටපතක් සමග අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර, ලියුම්කවරයේ ඉහළ වම්පස කෙළවර "රාජ්‍ය ළමා නාට්‍ය උළෙල -2020 "යන්න සඳහන් කර 2020 සැප්තැම්බර් මස 15** වෙනි දින ප.ව.4.00 ට පෙර සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ රාජ්‍ය නාට්‍ය අනුමණ්ඩලය වෙත තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට කටයුතු කළ යුතුවේ.

අදාළ අයදුම්පත හා ව්‍යවස්ථාව **සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, රාජ්‍ය නාට්‍ය අනුමණ්ඩලය, 8 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල** යන ලිපිනයෙන් ලබාගත හැකිය. මීට අමතරව දිවයින පුරා ඇති දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි සංස්කෘතික නිලධාරී මගින් හෝ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ **www.culturaldept.gov.lk** යන වෙබ් අඩවියට පිවිසීමෙන් අදාළ අයදුම්පත් හා ව්‍යවස්ථාව ලබාගත හැකිය.

වැඩිදුර විස්තර 0112872385 / 0112882534 යන දුරකථන අංක ඇමතීමෙන් ලබාගත හැකිය.

අධ්‍යක්ෂ
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

# රාජ්‍ය ළමා නාට්‍ය උලෙළ - 2020
## සීමිත / විවෘත

### අරමුණු හා හැඳින්වීම

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, රටේ සංස්කෘතියේ යහපැවත්ම, සුසංයෝගය සහ ප්‍රවර්ධනය උදෙසා විවිධ සංස්කෘතික වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර, රාජ්‍ය නාට්‍ය උලෙළ ද එහි වැදගත් අංගයකි. දේශීය නාට්‍ය කලාවේ සමකාලීන ප්‍රවණතා හඳුනාගැනීමට ද, උක්ත විෂයෙහිලා කළ යුතු සාධනීය මැදිහත්වීම් සඳහා අදාළ පාර්ශව යොමු කිරීම වෙනුවෙන් ද මෙය සානුබලයක් සැපයෙතැයි අපේක්ෂා කෙරේ.

- 1959 සිට ක්‍රියාත්මක වන රාජ්‍ය නාට්‍ය උලෙළ මේ වන විට,

  (අ) දිගු නාට්‍ය ( සිංහල / දෙමළ )

  (ආ) කෙටි නාට්‍ය ( සිංහල / දෙමළ ) යන අංශ දෙකෙන් පවත්වනු ලැබේ.

- 1996 සිට රාජ්‍ය ළමා නාට්‍ය උලෙළ සීමිත/විවෘත ( සිංහල / දෙමළ / ඉංග්‍රීසි ) වශයෙන් තරග ඉසව් දෙකකින් සමන්විත වේ.

මෙම තරග ඉසව් සඳහා අදාළ පොදු අරමුණු සහ, පොදු කොන්දේසි ඇතුළත් වේ. ඒ ඒ තරග ඉසව් සඳහා වන සුවිශේෂ අරමුණු සහ කොන්දේසි හඳුන්වාදීම මෙම ලේඛනයෙන් සිදු කරනු ලැබේ. මෙම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමේ බලය සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සතු වේ.

පහත පොදු අරමුණු ඉටු කර ගැනීම සඳහා මෙම තරග ඉසව් පැවැත්වේ.

(අ) සංස්කෘතියේ සජීවී අංගයක් වන නාට්‍ය කලාවේ උසස් ප්‍රමිතීන් ඇති කිරීමට අනුබලදීම.

(ආ) උසස් නාට්‍ය, රසික ප්‍රජාව අගියස ඇගයීම මගින්, නාට්‍ය කලාවට සම්බන්ධ බහුවිධ පාර්ශව දිරිමත් කිරීම හා ඔවුන් ගෞරවාදරයට පාත්‍ර කිරීම.

(ඇ) උක්ත ක්‍රියාවලිය මගින් දේශීය නාට්‍ය සංස්කෘතිය පෝෂණය කිරීම.

## පොදු කොන්දේසි

1. ඒ ඒ නාට්‍ය තරගයට අදාළ විශේෂිත හා පොදු කොන්දේසිවලට තරගකරුවන් එකඟ විය යුතුය. (රාජ්‍ය නාට්‍ය / රාජ්‍ය කෙටි නාට්‍ය / රාජ්‍ය ළමා නාට්‍ය )

2. පුවත්පත් දැන්වීම් හා ජනමාධ්‍ය තුළින් ප්‍රකාශයට පත්කෙරෙන ප්‍රවෘත්ති හෝ දැන්වීම් නිවේදනයක් මගින් අයදුම්පත් කැඳවනු ලබන අතර සියලු නාට්‍ය තරග ඉසව් සඳහා ඉල්ලුම් කළ හැක්කේ ශ්‍රී ලාංකේය පුරවැසියන්ට පමණි.

3. ත්‍යාග, සම්මාන හා සහතිකපත්‍ර පිරිනමනු ලබන්නේ විධිමත් ලෙස පළමු වටයේ සිට අවසාන වටය දක්වා තරගකාරිව සලකා බලන නාට්‍ය නිර්මාණ සඳහා පමණි.

4. පූර්ව දැන්වීම් මගින් දක්වා ඇති ත්‍යාග, සම්මාන හා සහතිකපත්‍රවලට අමතරව යම් ප්‍රදානයක් කළ යුතු යැයි හෝ ප්‍රමිතීන් සාධනය නොකිරීම, අදාළ කොන්දේසි උල්ලංඝනය කිරීම යන කරුණු නිසා යම් ප්‍රදානයක් නොකළ යුතු යැයි හෝ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව හා රාජ්‍ය නාට්‍ය අනුමණ්ඩලය තීරණය කරන්නේ නම් ඒ අනුව ක්‍රියා කිරීමේ බලය සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සතු වේ.

5. අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමේ දී සත්‍ය හා නිවැරදි තොරතුරු දැක්විය යුතු අතර, එසේ නොවූ බව තහවුරු වුවහොත් තරගයෙන් ඉවත් කිරීමට හෝ ත්‍යාග, සම්මාන, සහතිකපත්‍ර ආදී ප්‍රදානයන් අවලංගු කිරීමට හෝ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සතු වේ.

6. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ රාජ්‍ය නාට්‍ය ප්‍රවර්ධන අංශය මගින් ලබාගත් මෙම විස්තර පත්‍රිකාව සමග ඇති අයදුම්පත සම්පූර්ණ කොට ඊට අදාළ පහත උපලේඛනයට අනුව අවශ්‍ය ලේඛන ද, තමන් අධ්‍යක්ෂණය කළ නාට්‍යයේ නිසි පරිදි සකස් කළ පිටපතක් ද, ස්වීය නාට්‍යයක් නොවන්නේ නම් එහි සිංහල පිටපත සහ එම නිර්මාණයට පාදක වූ මුල් විදේශීය නාට්‍ය ඉංග්‍රීසි පිටපතක් ද සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, රාජ්‍ය නාට්‍ය ප්‍රවර්ධන අංශය , 8 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ ගෙනවිත් භාර දිය යුතුය. තරග පිළිබඳ විස්තර හා අයදුම්පත්‍ර, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ රාජ්‍ය නාට්‍ය ප්‍රවර්ධන අංශයෙන් හෝ දිවයිනේ පිහිටි දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සංස්කෘතික නිලධාරි මගින් හෝ ලබාගත හැකිය. එලෙසම අදාළ අයදුම්පත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ මුහුණු පොතේ https://www.facebook.com/ culturaldept.gov.lk යන ලිපිනයෙන් ලබාගත හැකිය.

6.1 නාට්‍ය උලෙළ සඳහා ඉදිරිපත් කෙරෙන පිටපත් A4 ප්‍රමාණයේ කඩදාසියක තනි පැත්තේ යතුරු ලියනය කර හෝ පරිගණක මගින් සකසා නාට්‍යයේ කතා සාරාංශය හා චරිත හඳුන්වාදීම වෙනුවෙන්ම පිටු ඇතුළත් කර පැහැදිලිව ඉදිරිපත් කළ යුතු අතර, අත්අකුරින් ලියා ඉදිරිපත් කරන්නේ නම් එම අත් අකුරු ඉතා පැහැදිලි විය යුතුය. අයදුම්පත කියවීමට අපහසු නාට්‍යයන් හි අන්තර්ගතය ගැන නොසලකා පිටපත් ප්‍රතික්ෂේප කිරීමේ බලය සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව හා රාජ්‍ය නාට්‍ය අනුමණ්ඩලය සතුවේ. උලෙළ සඳහා ඉදිරිපත් කරන ලද නාට්‍ය අත්පිටපත් ආපසු ලබා දෙනු නොලැබේ.

7. අයදුම්පත් එවනු ලබන ලියුම්කවරයේ වම්පස ඉහළ කෙළවරේ **2020 රාජ්‍ය ළමා නාට්‍ය උලෙළ / 2020 රාජ්‍ය නාට්‍ය උලෙළ / 2020 රාජ්‍ය කෙටි නාට්‍ය උලෙළ** යන්න සඳහන් කර, අයදුම්පත්‍ර සමග පහත සඳහන් උපලේඛනයට අදාළ සියලුම ලිපිලේඛන එවිය යුතු අතර නොපැහැදිලි හෝ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

   7.1 නාට්‍යයේ රචකයා හෝ පරිවර්තක / අනුවර්තක, නාට්‍යයේ නිෂ්පාදක / අධ්‍යක්ෂ නොවන්නේ නම්, අදාළ පෙළ රචනය නිෂ්පාදනය සඳහා රචකයා / අධ්‍යක්ෂ වෙත බලය පැවරූ බව දැක්වෙන ලිපියේ පිටපතක්,

   7.2 නාට්‍යයේ සියලු ශිල්පීන්ගේ නාමලේඛනය, ඔවුන්ගේ ලිපිනයන් හා අත්සන් ලේඛනය,

   7.3 ළමා නාට්‍ය හැර අන් නාට්‍ය සඳහා ප්‍රසිද්ධ රඟුම්පාලක මණ්ඩලය විසින් දෙනු ලැබූ බලපත්‍රයේ ඡායාපිටපතක්,

8. සම්පූර්ණ කළ අයදුම්පත්‍රය හා ඊට අදාළ උපලේඛනය සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත එවූ පසු ඒවා ලියාපදිංචි කර ඊට අදාළ අංකයක් සහිතව තරගකරු වෙත දැනුම් දෙනු ලැබේ. තරගකරු, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සමග ගනුදෙනු කිරීමේ දී එම අංකය භාවිත කළ යුතුය.

9. එවන ලද අයදුම්පත්‍රය හා අනෙකුත් උපලේඛන පරීක්ෂා කර බලා එම නාට්‍ය පිටපත සමීක්ෂණය කිරීම නාට්‍ය තරගයේ පළමු වටයේදී සිදු කරනු ලැබේ.

10. තෝරාගත් නාට්‍ය පිටපත් , නාට්‍ය නිෂ්පාදක හෝ නාට්‍ය අධ්‍යක්ෂ අයදුම් කරන ලද දිස්ත්‍රික්කයේදී වේදිකාගත කළ හැකි අතර, මෙම නාට්‍ය තරගයේ දෙවන වටය සඳහා සුදුසුකම් ලැබූ නාට්‍ය වේ. මෙහිදී නාට්‍යයේ ගුණාත්මකභාවය අනුව අවසන්වටය සඳහා නිර්දේශ කෙරෙන නාට්‍ය පිළිබඳව කල්වේලා ඇතිව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් නාට්‍ය අධ්‍යක්ෂකවරුන් වෙත දැනුම් දෙනු ලැබේ.

11. නාට්‍ය උලෙලේ අවසන් වටය සංස්කෘතික කටයුතු දෙපාර්තුමේන්තුව විසින් නම් කරනු ලබන සුදුසු නාට්‍ය රංග ශාලාවක දී පැවැත්වේ.

12. අවසන් වටය සඳහා මූලික ශාලා හා ආලෝක පහසුකම් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන අතර මෙහිදී විශේෂ ආලෝක හා ශ්‍රව්‍ය දෘශ්‍ය ප්‍රයෝග සපයනු නොලැබේ.

13. නාට්‍ය අත්පිටපත් සමීක්ෂණය කිරීමේ සිට නාට්‍ය තරග අවසන් වටය දක්වා සියලු ඇගයීම් කටයුතු සිදු කරනු ලබන්නේ නාට්‍ය කලාව හා එහි අනුෂාංගික අංග පිළිබඳ දැනුමක් සහිත ප්‍රවීණ විනිශ්චය මණ්ඩලයක් විසිනි. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව හා රාජ්‍ය නාට්‍ය අනුමණ්ඩලය පත්කරන මෙම විනිශ්චය මණ්ඩලය, යම් හෙයකින් නාට්‍ය අධ්‍යක්ෂකවරයා විසින් පිළිනොගන්නේ නම්, තම නාට්‍ය වේදිකාගත කිරීමට පෙර, ලිඛිතව දැනුම්දීමෙන් තම නාට්‍යය ඉවත් කර ගත හැකිය. **විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ.**

14. තරග ආරම්භයේ සිට සම්මාන ප්‍රදානය දක්වා සියලු අදියරවලදී නාට්‍යකරුවන්ගේ යෝජනා සැලකිල්ලට ගන්නා අතර, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව හා රාජ්‍ය නාට්‍ය අනුමණ්ඩලයේ මගපෙන්වීම අනුව එම යෝජනා ක්‍රියාත්මක කරනු ඇත.

15. නාට්‍ය තරගයේ ඕනෑම වටයක දී නාට්‍යයක්, නියමිත දිනක, නියමිත ස්ථානයක ප්‍රදර්ශනය කරන බවට එකඟව සිටිය දී, නොවැළැක්විය හැකි හේතුවක් නොමැතිව එය ප්‍රදර්ශනය නොකරන්නේ නම්, උක්ත නාට්‍ය නිෂ්පාදක / අධ්‍යක්ෂ තම කැමැත්තෙන් නාට්‍ය ඉවත් කරගත් සේ සලකනු ලැබේ. යම් හෙයකින් එකඟ වූ පරිදි නාට්‍ය ප්‍රදර්ශනය කළ නොහැකි නම්, ඒ බව ප්‍රදර්ශනයට නියමිත දිනට අවම වශයෙන් දින 7 කට පෙර සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ වෙත ලිඛිතව දැනුම් දී, නව දිනයක් ලබා ගත යුතුය. එහෙත් තරග කාලසටහනට බාධා වන ලෙස දින ලබාදීමේ දුෂ්කරතා ඇති වුවහොත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව ඊට වග කියනු නොලැබේ.

16. නාට්‍ය උලෙළ සඳහා ඉදිරිපත් වන කිසිදු නාට්‍යකරුවෙකු වෙනුවෙන් ගෙවීමක් කිරීමට සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව බැඳී නොසිටිනමුත්, අවසන් වටය සඳහා තේරී පත්වන නාට්‍ය වෙනුවෙන් මූල්‍ය ප්‍රදානයක් ලබාදීමට සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව ක්‍රියා කරනු ඇත.

17. උලෙළ අවසානයේ පැවැත්වෙන ත්‍යාග, සම්මාන හා සහතිකපත්‍ර ප්‍රදානෝත්සවය මාධ්‍ය ආවරණය සහිතව සිදු කරනු ලබන රාජ්‍ය උත්සවයක් වන බැවින් තරගකරුවන් ඇතුළු සියලු පාර්ශවයන් ඊට සුදුසු ඇඳුමකින් සැරසී සහභාගී වීම අනිවාර්ය වේ.

18. නාට්‍ය උලෙළ සඳහා තෝරා ගනු ලබන නාට්‍ය පිළිබඳ අයිතිවාසිකම් පෑමක් හෝ විරෝධය පෑමක් නාට්‍ය උළෙලේ කවර හෝ අවස්ථාවක සිදුවුවහොත්, එය දිවුරුම් ප්‍රකාශයක් මගින් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් එම විරෝධතාව හෝ අයිතිවාසිකම් පිළිබඳව සලකා බලා එය නාට්‍යය උළෙලේ ප්‍රදර්ශනය කිරීම හෝ නොකිරීම පිළිබඳව හෝ සම්මාන සඳහා නිර්දේශ කර තිබුණත්, එම සම්මාන ප්‍රදානය කිරීම හෝ නොකිරීම පිළිබඳව අවසන් තීරණය ගැනීමේ අයිතිය සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව හා රාජ්‍ය නාට්‍ය අනුමණ්ඩලය සතු වේ.

# රාජ්‍ය ළමා නාට්‍ය උලෙළ -2020

## රාජ්‍ය ළමා නාට්‍ය උළෙලේ සීමිත අංශය

1. රජයේ හෝ රජයේ නොවන පාසල්වලින් ඉදිරිපත් කෙරෙන ළමුන් විසින් රඟ දක්වන නාට්‍ය මේ ගණයට අයත් වේ.

2. ඉදිරිපත් කරන නාට්‍ය ස්වතන්ත්‍ර / පරිවර්තන / අනුවර්තන හෝ වෙනත් ඕනෑම ආකෘතියකට ඇතුළත් කළ හැකිය. නිර්දිෂ්ට ග්‍රන්ථ හෝ නිර්දිෂ්ට නාට්‍යවලින් උපුටාගත් කොටසක් පමණක් මේ සඳහා ඉදිරිපත් කළ නොහැකිය.

3. නාට්‍ය ඇගයීමේදී සජීවී සංගීතය පමණක් සැලකිල්ලට ගනු ලැබේ.

4. නාට්‍යයට සහභාගී වන නළු, නිළියන්, නර්තන, සංගීත, වෙස්ගැන්වීම්, පසුතල වේදිකා සැරසිලි හා වෙනත් සැලසුම් ශිල්පීන් හා රංගවස්ත්‍ර නිර්මාණ ශිල්පීන් එම විදුහලේම ශිෂ්‍ය ශිෂ්‍යාවන් හෝ ගුරුවරුන් විය යුතුය.

5. ඒ ඒ වයස් කාණ්ඩ සඳහා ම නිෂ්පාදනය වන නාට්‍ය ඇත්නම් ඒ බව අයදුම්පතෙහි සඳහන් කිරීම වැදගත් වේ.

6. නාට්‍ය වේදිකාගත කරන කාලය විනාඩි 20 – 30 ත් අතර වීම සුදුසුය. උපරිම කාල සීමාව ඉක්මවා නොයාම අපේක්ෂා කෙරේ.

7. නාට්‍ය සඳහා සහභාගී වන සමස්ත ශිල්පීන් සංඛ්‍යාව ( අනුෂාංගික අංග සඳහා සහභාගී වන ශිල්පීන් ද ඇතුළුව ) 35 දෙනෙකුගේ උපරිමයකට යටත් විය යුතුය.

8. තරගයට ඉදිරිපත් වන නාට්‍ය 2019 වසර හෝ 2020 වසරවල නිෂ්පාදිත හෝ නිෂ්පාදනය කෙරෙන නාට්‍ය විය යුතුය. කලින් අවස්ථාවල මෙම තරගය සඳහා ඉදිරිපත් කළ නාට්‍ය පිටපත් නැවත සලකා බලනු නොලැබේ.

9. නාට්‍ය පිටපත ළමා ක්‍රියාකාරකම් සහිතව ළමා මනසට යෝග්‍ය වූ ඔවුන්ගේ යථාර්ථවාදී ජීවිතය පිළිබිඹු වන කතාවක්, සිද්ධියක් හෝ මන:කල්පිතයක් මුල් කරගත් ළමුන් සඳහාම වූ රචනාවක් විය යුතුය. ළමා කාලය ලෙස සලකනු ලබන්නේ වයස අවුරුදු 06 සිට 14 දක්වා කාලයයි. නමුත් අවුරුදු 15 – 18 දක්වා පාසල් සිසුන් ද නාට්‍ය සඳහා යොදවාගත හැකිය. එම වයස් සීමාවන්හි ගතිලක්ෂණ හා ක්‍රියාකලාප මෙහිදී අදාළ ලෙස උපයෝගී කර ගැනීම අපේක්ෂා කෙරේ.

10. උලෙළට ඉදිරිපත් කෙරෙන නාට්‍ය අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පවත්වන නාට්‍ය තරගයට හෝ වෙනත් තරගයකට ඉදිරිපත් කර තිබීම මෙම උලෙළට ඇතුළුවීමට බාධකයක් නොවේ. එහෙත් ඒ බව සඳහන් කිරීම වැදගත් වේ.

11. අයෙකුට ඉදිරිපත් කළ හැකි නාට්‍ය පිටපත් සංඛ්‍යාවෙහි සීමාවක් නොමැත. එහෙත් ඒ එක් එක් නාට්‍ය සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර, ආවරණ ලිපියක් සහිතව විදුහල්පතිතුමා මගින් ඉදිරිපත් කළ යුතුය.

12. අවුරුදු 15 සිට 18 දක්වා පාසල් ළමුන් යොදවා ඉදිරිපත් කරන ළමා නාට්‍ය අදාළ වයස් කාණ්ඩයේ ගතිලක්ෂණ ක්‍රියාකලාපවලට හා අත්දැකීම්වලට අනුකූල විය යුතුය.

13. භාෂාව යොදා ගැනීමේදී පොදු ළමා ප්‍රේක්ෂකාගාරයකට ගැළපෙන වදන් භාවිත කිරීමට විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය.

## <u>රාජ්‍ය ළමා නාට්‍ය උළෙලේ විවෘත අංශය</u>

1. කලායතන, ළමා සමාජ, යෞවන සමාජ, සංවිධාන, ළමා නාට්‍ය කණ්ඩායම්වලට හා පුද්ගලයන්ට විවෘත තරගයට ඇතුළත් විය හැකිය.

2. නාට්‍ය වේදිකාගත කරන කාලය විනාඩි 20 - 30 ත් අතර වීම සුදුසුය. උපරිම කාලසීමාව ඉක්මවා නොයාම අපේක්ෂා කෙරේ.

3. නාට්‍ය සඳහා සහභාගී වන රංගන ශිල්පීන්ගේ වයස් සීමාවක් නොමැති වුවද ළමා හා යෞවන ශිල්පීන්ට ප්‍රමුඛත්වයක්දීම අපේක්ෂා කෙරෙන අතර නාට්‍යයේ සමස්ත ශිල්පීන් සංඛ්‍යාව ( අනුෂාංගික අංගවලට සහභාගී වන ශිල්පීන් ද ඇතුළුව ) 35 දෙනෙකුගේ උපරිමයකට යටත් විය යුතුය.

4. උලෙළට ඉදිරිපත් කෙරෙන නාට්‍ය 2019 හෝ 2020 වසරවල නිෂ්පාදිත හෝ නිෂ්පාදනය කෙරෙන නාට්‍ය විය යුතුය.

5. නාට්‍ය පිටපත ළමා ක්‍රියාකාරකම් සහිතව, ළමා මනසට යෝග්‍ය වූ ඔවුන්ගේ යථාර්ථවාදී ජීවිතය පිළිබිඹු වන කතාවක්, සිද්ධියක් හෝ මන:කල්පිතයක් මුල් කරගත් ළමුන් සඳහා වූ රචනාවක් විය යුතුය.

6. නිර්දිෂ්ට ග්‍රන්ථ හෝ නිර්දිෂ්ට නාට්‍යවලින් උපුටාගත් කොටස් මේ සඳහා ඉදිරිපත් කළ නොහැකිය.

## <u>රාජ්‍ය ළමා නාට්‍ය උලෙළ සඳහා වූ පොදු කොන්දේසි</u>

1. සියලුම නාට්‍යකරුවන් ළමා නාට්‍ය උලෙළ සඳහා ඉදිරිපත්වීමට සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ රාජ්‍ය නාට්‍ය ප්‍රවර්ධන අංශය වෙතින් මේ සමග නිකුත් කරන අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර, තම නාට්‍යයේ පිටපත් 03 ක් හා සාරාංශ පිටපතක් ද සහිතව අයදුම්පතෙහි සියලු කරුණු සත්‍ය බවට විදුහල්පතිතුමා / විදුහල්පතිතුමිය හා නාට්‍ය නිෂ්පාදක විසින් සහතික කර අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන 2020.09.15 වැනි දින හෝ ඊට පෙර, **අධ්‍යක්ෂ, රාජ්‍ය නාට්‍ය අනුමණ්ඩලය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 8** වන **මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනැවිත් භාරදිය හැක. (මේ සඳහා ගාස්තු අයකරනු නොලැබේ) අයදුම්පත් එවන විට නොවරදවාම ලියුම්කවරයේ වම්පස ඉහළ කෙළවරේ **" 2020 රාජ්‍ය ළමා නාට්‍ය උලෙළ සීමිත / විවෘත"** යන්න සඳහන් කළ යුතුය. නාට්‍ය අත්පිටපත් ස්වාධීන සමීක්ෂණ මණ්ඩලයක් මගින් තෝරා, දෙවන වටයේ නිෂ්පාදනයට සුදුසු පිටපත් පිළිබඳ අදාළ නිෂ්පාදකවරුන්ට / විද්‍යාලයට / ආයතනයට ඔක්තෝබර් මාසයේ දී දැනුම් දෙනු ලැබේ. **( අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2020.09.15)**

2. දෙවන වටයේ ප්‍රදර්ශනය සඳහා තෝරාගත් නාට්‍ය, දිස්ත්‍රික් හෝ පළාත් අනුව තෝරා වෙන්කර අයදුම්කරුවන්ට ආසන්නතම මධ්‍යස්ථානයකදී ප්‍රදර්ශනය කිරීමට දින නියම කර දන්වනු ලැබේ. මෙම දර්ශන දිවා කාලයේදී පවත්වන බැවින්, වේදිකාගත කිරීමේදී රංගාලෝකය සපයනු නොලැබේ. එබැවින් නාට්‍ය තේරීමේදී අංගරචනය, රංගවස්ත්‍ර හා රංගාලෝකය පිළිබඳ විනිශ්චය මණ්ඩලය සැලකිලිමත් නොවනු ඇත. එහෙත් නළුවන් දිරිගැන්වීමට සහ පුහුණු කරවීමට රංගවස්ත්‍ර, වේදිකා භාණ්ඩ, සැරසිලි හා අංගරචනය උපයෝගී කරගැනීම නාට්‍ය අධ්‍යක්ෂවරයාගේ මනාපය පරිදි කළ හැකිය. මෙය නාට්‍ය පිළිබඳ වැඩි අවබෝධයක් ලබාදීමට උපකාරී වනු ඇත.

3. උලෙළ සඳහා ඉදිරිපත් කෙරෙන නාට්‍ය පිටපත් අයදුම්කරුවන් වෙත ආපසු ලබා දෙනු නොලැබේ.
4. ඉදිරිපත් කරන නාට්‍ය පිටපතෙහි රචකයාගේ නම සඳහන් නොකළ යුතුය. එහෙත් අයදුම්පතෙහි සඳහන් කළ යුතුය.
5. එම නාට්‍ය අතරින් විනිශ්චය මණ්ඩලයේ තීරණයට අනුව අවසාන වටයේදී ප්‍රදර්ශනය සඳහා වඩාත් සුදුසු නාට්‍ය තෝරා ගනු ලැබේ.
6. දෙවන වටයේ නාට්‍යවල කැපීපෙනෙන කුසලතා දක්වන ශිල්පීන් වෙත කුසලතා සහතිකපත්‍රයක් සම්මාන උළෙලේදී ප්‍රදානය කරනු ලැබේ.
7. ගුණාත්මක නාට්‍ය සංඛ්‍යාව වැඩි වුවහොත්, දෙවන පූර්ව වටයක් නැරඹීමට විනිශ්චය මණ්ඩලය තීරණය කරනු ඇත.
8. අවසාන වටයට තෝරාගත් නාට්‍ය කොළඹ දී උත්සවාකාරයෙන් වේදිකාගත කිරීමට අපේක්ෂිතය. රාජ්‍ය ළමා නාට්‍ය උලෙළ සම්මාන ප්‍රදානෝත්සවයේදී අවසාන වටයට සුදුසුකම් ලබන සෑම නාට්‍යයක් සඳහාම එලකයක් බැගින් ප්‍රදානය කරනු ලැබේ.
9. ප්‍රවීණ නාට්‍ය විනිශ්චය මණ්ඩලයක් විසින් අවසාන වටයේ නාට්‍ය ඇගයීම කරනු ලබන අතර, එම තීරණ අනුව මතු දැක්වෙන තිළිණ, මූල්‍ය ත්‍යාග සහ සහතිකපත්‍ර සීමිත හා විවෘත අංශ සඳහා පිරිනමනු ලැබේ.

<u>**සීමිත හා විවෘත නාට්‍ය සඳහා පිරිනමන සම්මාන, මූල්‍ය ත්‍යාග හා සහතිකපත්‍ර පහත පරිදි වේ.**</u>

- වසරේ හොඳම නාට්‍ය නිෂ්පාදනය
  - ප්‍රථම ස්ථානය - රු. 50,000.00
  - දෙවන ස්ථානය - රු. 30,000.00
  - තෙවන ස්ථානය - රු. 25,000.00
- වසරේ හොඳම නාට්‍ය පිටපත් රචනය
  - ප්‍රථම ස්ථානය - රු. 25,000.00
  - දෙවන ස්ථානය - රු. 15,000.00
  - තෙවන ස්ථානය - රු. 10,000.00
- වසරේ දක්ෂතම ළමා නළුවා - රු. 20,000.00
- වසරේ දක්ෂතම ළමා නිළිය - රු. 20,000.00
- වසරේ දක්ෂතම සහාය ළමා නළුවා - රු. 10,000.00
- වසරේ දක්ෂතම සහාය ළමා නිළිය - රු. 10,000.00
- වසරේ හොඳම සංගීත නිර්මාණය - රු. 15,000.00
- වසරේ හොඳම අංගරචනය හා වෙස්ගැන්වීම - රු. 15,000.00
- වසරේ හොඳම රංගවස්ත්‍ර නිර්මාණය - රු. 15,000.00
- වසරේ හොඳම වේදිකා පසුතල නිර්මාණය - රු. 15,000.00
- වසරේ හොඳම වේදිකා පරිපාලනය - රු. 15,000.00
- වසරේ හොඳම රංගාලෝකය - රු. 15,000.00
- වසරේ හොඳම රංගවින්‍යාසය - රු. 15,000.00
- වසරේ හොඳම ශබ්ද පරිපාලනය - රු. 15,000.00

❖ මීට අමතරව සීමිත හා විවෘත අංශයන්හි විශේෂ කුසලතා සඳහා විනිශ්චය මණ්ඩලයේ තීරණය පරිදි කුසලතා සහතිකපත්‍ර හා මූල්‍ය ත්‍යාග පිරිනමනු ලැබේ.

**<u>විශේෂ කරුණු</u>**

- අවසන් වටයට පෙර පවත්වනු ලබන නාට්‍ය නිෂ්පාදක හමුවේදී ලබාදෙන දායකත්ව විස්තරය, අවසන් දායකත්ව විස්තරය ලෙස සැලකිය යුතුය. (නාට්‍යයට සම්බන්ධ සියලු ශිල්පීන්ගේ අත්සන එම විස්තරයට අයත් විය යුතුය.)
- යම් අවස්ථාවකදී අවසන් වටයේ නාට්‍ය ප්‍රදර්ශනයට පෙර ( අදාළ දිනයේ ) නාට්‍යයට සම්බන්ධ ශිල්පියා හෝ ශිල්පිනිය වෙනස් වන්නේ නම්, ඔහුගේ හෝ ඇයගේ අත්සනින් යුතු ලිපියක් සංස්කෘතික කටයුතු දෙපාර්තමේනතුවේ රාජ්‍ය නාට්‍ය ප්‍රවර්ධන අංශය වෙත භාරදීමෙන් එම නම වෙනස් කළ හැකිය. එහි පූර්ණ වගකීම නාට්‍ය අධ්‍යක්ෂවරයා විසින් භාර ගත යුතුය.
- මෙම නාට්‍ය උළෙලේදී නාට්‍යයට අදාළ අසත්‍ය තොරතුරු සැපයීම හෝ තරග නීති රීති හා කොන්දේසි උල්ලංඝනය කිරීම එවැනි නාට්‍ය ඉවත් කිරීමේ හා ජයග්‍රහණ අවලංගු කිරීමේ බලය සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ රාජ්‍ය නාට්‍ය අනුමණ්ඩලය සතුවේ.
- සුවිශේෂ ගණයේ පිටපත් ලෙස තෝරා ගනු ලබන ජයග්‍රාහී නාට්‍ය වෙතොත් ඒවා මුද්‍රණය කිරීම කෙරෙහි රාජ්‍ය නාට්‍ය අනුමණ්ඩලයේ අවධානය යොමු කරනු ලැබේ.
- සුවිශේෂ නාට්‍ය නිෂ්පාදන ඇතොත් ඒවා පළාත් මට්ටමින් ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරනු ලැබේ.
- සෑම වසරකම අවසාන වටයේ ප්‍රථම ස්ථානය හිමි කරගන්නා සීමිත හා විවෘත අංශවල නාට්‍ය දෙක ඊළඟ වසරේ නාට්‍ය උළෙලේදී ප්‍රදර්ශනය කිරීමට අපේක්ෂිතය.
- සීමිත උළෙල සඳහා නාට්‍ය පිටපත් ඉදිරිපත් කරන රචකයින්, නිෂ්පාදකයින් ළමා නාට්‍ය පිළිබඳ සංවිධානය කරන මූලික වැඩමුළුවට සහභාගී කර ගැනීමට නියමිතය.
- විවෘත උළෙල සඳහා නාට්‍ය පිටපත් ඉදිරිපත් කරන රචකයින්, නිෂ්පාදකයින් ප්‍රාදේශීය වැඩමුළුවලට සහභාගී කර ගැනීමට කටයුතු කරනු ලැබේ.
- මෙම නාට්‍ය උළෙලෙහි සීමිත හෝ විවෘත අංශවලට නාට්‍ය ඇතුළත් කිරීමට හෝ ඊට සහභාගීවීමට සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ නිලධාරීනට හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ට අවසර නොමැත.
- සීමිත හා විවෘත අංශ නාට්‍ය වෙනුවෙන් එක් සම්මානයක් සඳහා උපරිම ශිල්පීන් දෙදෙනෙකුගේ නම් පමණක් ඉදිරිපත් කළ යුතුය.
- නාට්‍ය විනිශ්චය සම්බන්ධයෙන් දෙනු ලබන තීරණය විනිශ්චය මණ්ඩලයේ අවසාන තීරණය වන්නේය.

මෙම ලේඛනය යථෝක්ත රාජ්‍ය ළමා නාට්‍ය උළෙලේ මූලික ව්‍යවස්ථාව වන අතර, මෙම ව්‍යවස්ථාව 2020 ජනවාරි 31 වැනි දින සිට වලංගු විය යුතුය. මෙම නාට්‍ය උළෙළ සම්බන්ධ ව ඇති එකම තීරණාත්මක ලියවිල්ල මෙය වේ. උපලේඛනගත ඉල්ලුම්පත්‍රය ද මෙම ව්‍යවස්ථාවේ කොටසක් වශයෙන් සැලකිය යුතු වන අතර, උළෙළ පිළිබඳ අවශ්‍ය පැහැදිලි කිරීම් හා වැඩිවිස්තර සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ රාජ්‍ය නාට්‍ය අනුමණ්ඩලය විසින් අයදුම්කරුවන්ට අවශ්‍ය අවස්ථාවන්හිදී ලිපි මගින් හෝ දුරකථනයෙන් හෝ දැනුම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථාව අර්ථකථනය කිරීම හෝ සංශෝධනය කිරීම, පරිච්ඡින්න කිරීම හෝ නව ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමේ වගකීම සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව හා රාජ්‍ය නාට්‍ය අනුමණ්ඩලය සතු වේ.

T.A. Gamage 2020/06/29

තරණි අනෝජා ගමගේ
සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ (වැ.බ.)
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

විමසීම් : රාජ්‍ය නාට්‍ය ප්‍රවර්ධන අංශය : 0112872385/0112882534